සිවලිංගම් ගුණරත්නම්
සභාපති
නාවිදන්වෙලි ප්‍රාදේශීය සභාව

දැනුයි පැළේ ඉන්දලා තියෙන්නෙ. කාලෙකට පස්සෙ ලොකු ගහක් වෙලා ඵල ලබලා දෙන වගකීම තියෙනවා. ඒ පැළෙ හා වෘක්ෂයක් කරගන්න කරන තියෙන දේවල් ටික අපි කරන්න ඕන.

පොන්නුන්තුරෙ රමේෂ්
තාක්ෂණික නිලධාරි
නාවිදන්වේලි ප්‍රාදේශීය සභාව

මේක සෑහෙන කාලයක් සංවර්ධනය අපේක්ෂාවෙන් සිටි ප්‍රදේශයක් මේ වගේ සංවර්ධන ව්‍යාපෘති නිසා මිනිස්සු සතුටින් ඉන්නවා. ජනතා සහභාගිත්වයක් ඇතුව ඔවුන්ගේ අවශ්‍යතා හා සැලසුම් අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරෙන නිසා මේවා දීර්ඝකාලයක් පවතින් ස්වභාවයක් තියෙනවා.

මුගමදු අලියාර් මුහමඩ් නාහීර්
සභාපති
නින්දවුර් ප්‍රාදේශීය සභාව

පුර නැඟුම වැඩසටහන තියනවට වඩා 'නෙල්සිප්' කියන නම තමයි මිනිස්සුන්ගේ හිත්වල පැලපදියම්වෙලා තියෙන්නෙ. දැන් අපි වෙනත් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන්ඩ ගියත් මිනිස්සු අපෙන් අහන්නේ මේකත් 'නෙල්සිප්' වගේ තියෙයිද කියලයි.

දොස්තර මුහමඩ් මව්රූප් හිල්මි
සභාපති
තින්යා නගරසභාව

පළාත් පාලන ආයතනවලට මේ වැඩසටහන මඟින් අත්දැකීම් රැසක් ලබාගත්තා. පුර නැඟුම නිසා විනිවිදභාවයක් ඇතිව වැඩ කරන්න ඕනය කියන එක අපි දැන කියාගත්තා සේවකයන්ගේ හැකියාවනුත් වර්ධනය වෙලා තියෙනවා. ජනතා සහභාගිත්වයක් සහිත සැලසුම් පිළිබඳවත් වගවීමේ ස්වභාවය පිළිබඳවත් අපි මේකෙන් ඉගෙන ගත්තා. දැනට අපත් සමඟ ඉන්න සේවක පිරිස යොදාගෙන වුණත් අනෙකුත් ව්‍යාපෘතීන් එක වෙලාව සියයට සියයක් අපටම ස්වාධීනව ඒ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරන්න පුළුවන්ය කියන එක ගැන කිසිම සැකයක් නෑ.

අහමඩ් මුතෙදීන් හරීස්
සභාපති
මුත්තූර් ප්‍රාදේශීය සභාව

ප්‍රාදේශීය සභාවේ සේවය නියුතු නිලධාරින්ට ලබා දුන් පුහුණුවත් ඔවුන් වෙනුවෙන් පැවැත්වූ ආදර්ශ සම්මන්ත්‍රණත් සභාව හොඳින් පවත්වාගෙන යන්නට අවශ්‍ය පසුබිම සකසා දෙන්නට හේතුවී තිබෙනවා. මේ වැඩ සටහන මඟින් ක්‍රියාත්මක කරන සෑම ව්‍යාපෘතියක්ම ප්‍රදේශයේ ජනතාවගේත් සභාවේත් හොඳ නම රැකගෙන දිගුකල් පවතින තත්ත්වයකට ක්‍රියාත්මක වී ඇති වග පෙනෙන්නට තිබෙනවා.

ඒ.පේ. මුහම්මඩ් ඉර්ෂාඩ්
පළාත් පළාත් පාලන නියෝජ්‍ය කොමසාරිස්
නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ
අම්පාර

මෙම වැඩසටහන යටතේ ව්‍යාපෘතීන් ක්‍රියාවට නැඟීම සඳහා වන දැනුමත්, අත්දැකීමත් පළාත් පාලන ආයතන ලබාගෙන තිබෙනවා. මේ වන විට ක්‍රියාත්මක කළ හැකි ව්‍යාපෘති සැලසුම් පවා පළාත් පාලන ආයතන සතුව තිබෙනවා. ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් ලැබෙන්නේ නම් තවත් සංවර්ධන ව්‍යාපෘතීන් රැසක් ක්‍රියාත්මක කිරීමේ හැකියාව හා දක්ෂතාවය පළාත් පාලන ආයතනවලට තිබෙනවා. මේ නිසා තවත් මෙවැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ සූදානමක් අපට තිබෙනවා.

එසේම මෙම වැඩසටහන මඟින් ක්‍රියාත්මක කරවන ලද ව්‍යාපෘතීන් ශක්තිමත් වගේම ජනතා අවශ්‍යතා හඳුනාගෙන ඒවාට ප්‍රමුඛතාව දෙමින් ක්‍රියාවට නැගූ නිසාවෙන් එයට ජනතා සහයෝගයත් ලැබී තිබෙනවා. එම නිසා මෙබඳු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී ඒවායේ කල්පැවැත්ම පිළිබඳ දැඩි අවධානයක් යොමු කෙරෙන බව නම් සහතිකයි.

සාහුල් හමීඩ් මුහමඩු අස්වර්
සභාපති
කාන්තන්කුඩි නගර සභාව

ජෙයිකා, ගම නැඟුම, මග නැඟුම වගේ වැඩසටහන් මඟින් අපෙන් ව්‍යාපෘතීන් ඉල්ලා හිටිය අවස්ථාවලදී අපි ප්‍රධාන සැලැස්ම (ටීඑෆ් ඡක්බ) පෙන්නලා උදව් අරගත්තා. ඒකට පුර නැඟුමන් අපට උදව් කළා. ඒ අනුව ජෙයිකා වැඩසටහන යටතේ කාණු පද්ධතියෙන් අපේ ප්‍රධාන සැලැස්ම අනුව ඉදිකෙරුණා.

ඒ වගේම මාර්ග සංවර්ධන අධිකාරිය (ඤඅ) මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව (ඤඅඅ) යන ආයතනයන් ප්‍රධාන සැලැස්මට අනුව ඔවුන්ගේ පාරවල්වලටත් කාණු බැඳ තිබෙනවා.

එන්.එච්. ධනුෂිකා ලක්මාලි
කළමණාකරණ සහකාර
කන්තලේ ප්‍රාදේශීය සභාව

මීට කලින් ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරුණේ නිලධාරීන්ගේ දේශපාලකයන්ගේ කැමැත්තටයි. ඒත් පුර නැගුම ජනතා අදහස් අරගෙන ඒ මත ක්‍රියාත්මක කෙරෙන වැඩසටහනක්. ඒ නිසාම ඒකේ කල්පැවැත්මන් සහතිකයි.

ඒ.පී.එම් අස්රප්
පුර නැගුම හිටපු
නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ
ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
කොළඹ

පළාත් පාලන ආයතනවල මූල්‍ය කළමනාකරණය, සැලසුම් සකස් කිරීම, පරිපාලනය වගේ ක්ෂේත්‍ර පිළිබඳව අපි ඔවුන්ට වසර තුන හතරක් තිස්සේ පුහුණු කරනවා. දැන් ඔවුන් ඒ පුහුණුව ලබලා.

මේ නිසා දැන් යම් ව්‍යාපෘතියක කල් පැවැත්ම තියෙන්නෙ කා අතේද කියලා බැලුවොත්, ඒක තියෙන්නෙ සැලැස්මේ නෙවෙයි. දැනටත් අපි මේ ක්‍රියාත්මක කරමින් ඉන්නේ මීට කලිනුත් තිබුණු කාරණා හා වැඩපිළිවෙළවල්මයි. ඒකට සැලැස්ම ජවයක් වෙලා තියෙනවා. මෙතෙන්දි පළාත් පාලන කොමසාරිස් නියෝජ්‍ය පළාත්පාලන කොමසාරිස් ජනතා නියෝජිතයන් සහ සෙසු සේවකයන් තමයි ව්‍යාපෘතියක කල් පැවැත්ම සහතික කරන්න ඕන. එහෙම නැතිව ඒක ව්‍යාපෘතියට අයිති දෙයක් නොවෙයි. සැලැස්ම පාරක් පෙන්නලා දෙනවා. ඒක දිගේ ඉස්සරහට යන එක මේ කිව්ව අයගේ වැඩක්.

ජෝශප් විජයකුමාර්
ලේකම්
මන්මුණෙ බටහිර ප්‍රාදේශීය
සභාව

ආදායම් වැඩිවීම, තාක්ෂණය, විගණන ක්‍රම, සෙසු වාර්තා එළි දැක්වීම වැනි සංවර්ධනාත්මක අංග මෙම පුර නැගුම වැඩසටහන යටතේ අප ලබාගෙන තිබෙනවා.

මේ වන විට අපේ සේවකයන් දැනුම්වත්වී තිබෙනවා. තමනුත් ආයතනික සංවර්ධනයේ හවුල්කරුවන්ය යන්න පෙන්නුම් කිරීම සඳහා සියලුම වාර්තා නිසි කලට වේලාවට සකස් කර, ඉදිපත් කරමින් රාජ්‍ය ප්‍රතිපත්ති නිවරැදිව අනුගමනය කරනු දැකිය හැකියි. මේ තත්ත්වය ඇති කළේ පුර නැගුම යැයි කීම අතිශයෝක්තියක් නොවේ.

සීනි මුහමඩ් සුෂියාන්
සභාපති
තම්පලගම ප්‍රාදේශීය සභාව

පුර නැගුමෙන් නාගරීකරණයවන තඹලගම

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මහින්ද චින්තනය යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන කුඩා නගර සංවර්ධනය කිරීමේ වැඩසටහන හෙවත් පුර නැගුම වැඩසටහන මඟින් මේ වසර සඳහා තඹලගම ප්‍රාදේශීය සභාවට රුපියල් මිලියන 44.5 ක මුදලක් වෙන්කර දී තිබෙනවා.

තඹලගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පසුගිය යුද වාතාවරණය හේතුවෙන් දැඩි බලපෑමකට ලක්වූ නිසාවෙත්, ප්‍රදේශය ආර්ථිකය, මංමාවත්, අධ්‍යාපනය, ක්‍රීඩා සහ විනෝද කටයුතු ආදී වූ සියලුම ක්ෂේත්‍ර සංවර්ධනය කළ යුතු තත්ත්වයට පත්ව තිබේ.

එම නිසා 2011 සහ 2012 වසර සඳහා වෙන්කෙරුණු රුපියල් මිලියන 66.5 යොදා ගනිමින් වසර ගණනාවක් තිස්සේ නවීකරණය නොකෙරුණු වුල්ලිපොතාන් මධ්‍යම මාවත, සිරාජ්කුඩා මාවත, කොබ්බෑකඩුව මාවත, පුදුකුඩිඉරුප්පු මාවත. 99 කණුව පාසල් මාවත, මූහම්මදියා නගර මාවත, 98 කණුව මංසන්ධි මාවත වැහි ප්‍රධාන මාර්ග ඇතුළුව කිලෝමීටර් 7.28 ක් දිග මාර්ග කොන්ක්‍රීට් අතුරා නවීකරණය කර ප්‍රදේශයේ මං මාවතේ පිළිසකර කර තිබෙනවා.

මෙවර වෙන්කර ඇති මුදලින් අධ්‍යාපන ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා මෙම ප්‍රාදේශීය සභාව යටතේ ක්‍රියාත්මක මුල්ලිපොතාන්, තබලගම පිහිටා ඇති මහජන පුස්තකාල දෙකට අමතරව රුපියල් මිලියන 4.7ක වියදමකින් පුදුකුඩිඉරුප්පුවල කියවීම් ශාලාවක් සහිත ප්‍රජා මධ්‍යස්ථානයක් ක්‍රීඩා හා විනෝද කටයුතු පහසුකම් ඉහළ නැංවීමේ අදහසින් හමීදියා හා ගල්මැටියාව යන මහජන ක්‍රීඩා පිටි රුපියල් මිලියන 11.8 ක වියදමකින් ප්‍රතිසංස්කරණය කිරීමට නියමිතයි. ඊට අමතරව රුපියල් මිලියන 7 ක වියදමක් දරා සිරාජ් නගරයේ අලුත් ළමා උද්‍යානයක් ඉදිකිරීමටත් නියමිතයි.

එසේම ආදායම් අඩු මේ සභාවට ස්ථිර ආදායම් මාර්ගයක් ඇතිකර ප්‍රදේශයේ ව්‍යාපාරිකයන්ට හොඳ වෙළෙඳ අවස්ථාවකුත්, පාරිභෝගිකයන්ට හොඳ සේවා සැපයුමකුත් ලබා දීමේ අරමුණින්, මේ දක්වා ටකරං මඩුවල ක්‍රියාත්මක වූ මුල්ලිපොතාන් සති පොළ රුපියල් මිලියන 15.5 ක වියදමක් දරා ස්ථිර කඩපෙළක් බවට පත්කරන්නට කටයුතු යොදා ඇති බැවින් පසුගාමී තත්ත්වයක තිබූ තඹලගම ප්‍රදේශය මෙම පුර නැගුම වැඩසටහන මඟින් නාගරීකරණය වෙමින් තිබේ.

පුර නැගුම වැඩසටහනේ යහපත වැඩියි

දොස්තර මුහමඩ් මහ්රූෆ් හිල්මි
සභාපති, කින්යා නගර සභාව

ආර්ථික අතින් අපගේ වර්ධනය අඩු මට්ටමක තිබුණත්, අනෙකුත් අය කරනවාට වඩා යම් හොඳක් අප සමාජයට කරමින් ඉන්නවා.

පුර නැගුම වැඩසටහන නැත්නම් අපි තවමත් ඉන්නේ හිස් අතින් අපට රුපියල් මිලියන 102.15 ක මුදලක් ලැබුණු නිසා ජනතාවගේ අවශ්‍යතා හඳුනාගෙන ඔවුන්ට යම් සේවයක් කරන්න මෙය අපට හොඳ අවස්ථාවක් වුණා වගේම දේශපාලනිකවත් අප අඩියක් ඔසවා තබා තිබෙනවා.

පුර නැගුම වැඩසටහන නගරසභාව මඟින් ක්‍රියාත්මක කරන අනෙකුත් ව්‍යාපෘතීන්වලටත් ආදර්ශයක් වී තිබෙනවා. වැඩක් කෙසේ කළ යුතු ද යන්නට මඟපෙන්වමින්, ඒ සඳහා අවශ්‍ය පුහුණුව ලබා දුන් අවධියේ අපගේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්නට තරම් සුදුසු හොඳ සේවක පිරිසක්ද අපට සකසා දී තිබෙනවා.

නිදසුනක් ලෙස බදජක 'මළුයදරසළහ ජරළසජසඑ්ළා ෘඩැකදවපැබළු ගැන මීට කලින් අපි කිසි දෙයක් දැනගෙන හිටියෙ නෑ. අපට ලැබෙන මුදල අනුව නගරසභාව තීන්දු කරන ව්‍යාපෘතියෙක් ක්‍රියාත්මක කරන ක්‍රමයකුයි අපට තිබුණේ. බ්ෂෘජ හරහා ඨභෘජ මඟින් කමිටු පිහිටුවා, එකී කමිටු මඟින් බිම්මට්ටමේ ජනතා කැමැත්ත මත ව්‍යාපෘතීන් තෝරා ගනු ලබනවා. එම ව්‍යාපෘතීන් සියල්ල එකට ගෙන, ග්‍රාමසේවා වසම් මට්ටමින් එකතු වී එමඟින් සම්බන්ධ වී පසුව සභාව විසින් අදාළ ව්‍යාපෘතිය අනුමත කරනු ලබයි. එයින් තීරණය කර පළාත් සභාව හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් තෝරා ගනු ලබන ව්‍යාපෘතීන්වලට බ්ෂෘජ ප්‍රයෝජනවත් වෙයි. බ්ෂෘජ හරහා ජනතා අවශ්‍යතා තේරුම් ගෙන කටයුතු කළ හැකි අයවලුන් බවට නගර සභා සේවකයන්ව පත් කර තිබෙනවා.

අද අප කරන සංවර්ධන ව්‍යාපෘතියක් මේ පරම්පරාවට පමණක් නොව ඊළඟ පරම්පරාවලටද ප්‍රයෝජනවත් විය හැකි ආකාරයේ කල් පැවැත්මක් ඇති එකක් විය යුතුය යන්න අපගේ දැඩි ස්ථාරවයයි. උදාහරණයක් විදිහට මාළු වෙළෙඳ සැල ගත්තොත් එය ධීවර ප්‍රජාවට උපකාරයක් විය හැකි ආකාරයටත්, නගර සභාවට ආදායමක් උපයාදිය හැකි ආකාරයටත් නිමවා තිබෙන බව දැන්වීමට පුළුවන.

මෙම ප්‍රදේශය ඉස්සන් වගාවට සුදුසු එකක් වුවත් මේ වනතුරුත් එයින් ප්‍රයෝජන ගෙන නැහැ. මේ නිසා ඉස්සන් වගාවට සුදුසු බිම නගර සභාවේ පාලනයෙන් පවත්වාගෙන යන්නට අදහස් කරගෙන සිටිනවා. එයත් සෞඛ්‍ය සම්පන්න හා හොඳ හිත වර්ධනය කරන ව්‍යාපෘතියක් වේවි. සෑම ව්‍යාපෘතියකම හොඳ වගේම නරකත් තියෙනවා. එයිනුත් හොඳ වැඩියි නම් ඒ ව්‍යාපෘති ක්‍රියාත්මක කරවන්නට හැකියි. මෙම ව්‍යාපෘතියේන් නරකට වඩා හොඳ වැඩියි.

ජනතා සහභාගිත්වයෙන් තොරව හුදෙකලා කිසිවක් කළ නොහැක

එම්.ජී තිලකරත්න
සභාපති පදවිය ශ්‍රී පුර ප්‍රාදේශීය සභාව

පුර නැගුම නොතිබුණා නම් පළාත් පාලන ආයතන නිකම්ම නිකං නමට විතරක් සීමාවෙන්ඩ තිබ්බා. පුර නැගුමේ උදව්වෙන් සේවකයෝ හොඳට වැඩ කරන්න පුරුදුවෙලා තියෙනවා.

පුර නැගුම වැඩසටහන යටතේ අපේ ප්‍රදේශයේ ජල සම්පාදන ව්‍යාපෘතියකුත් පොළ සංකීර්ණයකුත්, නිර්මාණය කළා. ඒත් එක්කම පාරවල් කිහිපයක්ම කොන්ක්‍රීට් කළා. ඒ වගේම ජයන්ති වැව කියන ප්‍රදේශයේ කාණු පද්ධතියක් හැදුවා. මේ අතරින් හොඳම ව්‍යාපෘතිය හැටියට ගැමුණුපුර ජල ව්‍යාපෘතිය හඳුන්වන්න පුළුවන්. මේක මේ ප්‍රදේශවාසීන්මයි ප්‍රමුඛ ව්‍යාපෘතිය හැටියට නම් කළේ.

මේ ප්‍රදේශයේ ජලයත් සමඟ රසායනික ද්‍රව්‍ය මිශ්‍රවෙලා තිබුණු නිසා ජනතාවගේ ප්‍රධානම අවශ්‍යතාව වුණේ පිරිසිදු ජලය. ඒ නිසාම මේ ජල ව්‍යාපෘතිය අනිවාර්යයෙන්ම කළ යුතු එකක් වුණා. මේ ව්‍යාපෘතිය නිසා 100-200 කට සෙත සැලසිලා තියෙනවා.

මෙවැනි ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරද්දී අපට යම් යම් අභියෝගවලට මුහුණ දෙන්නත් සිදුවුණා. විශේෂයෙන් ජනතාව කොතරම් පාර පෙන්නුවත් එය නොපිළිගන්නා තත්ත්වයක් තිබුණා. උදාහරණයක් විදිහට ශ්‍රමදානයක් සූදානම් කළොත් ගමේ ජනතාවට තම දෛනික වැඩකටයුතු පාඩු කරගනිමින් ශ්‍රමදානයට එක්වීමේ පසුබෑමක් තිබුණා

අප මෙහි පැමිණ සිටින්නේ ජනතාවට ප්‍රශ්න තිබෙන නිසයි. ඒ නිසා ජනතා සහයක් නොමැතිව අපට පමණක් තනිව කිසිවක් කරන්න පුළුවන්කමක් නෑ. ඒ වගේම ජනතාව කියන කියන හැමදේම අපට ඉෂ්ට කරන්න පුළුවන්කමකුත් නෑ. මේ නිසා ජනතාව ඉල්ලූ දෙයින් වැදගත්ම දේවල් පමණක් අප ලබා දුන්නා.

පුර නැගුම වැඩසටහන පළාත් පාලන ආයතනවලට ස්වාධීනව කටයුතු කිරීමට විශාල සහයෝගයක් ලබා දී තිබෙනවා. පුර නැගුම නොතිබුණා නම් නමට පමණක් සීමා වූ පළාත් පාලන ආයතන බවට මේවා පත්වෙන්නට ඉඩ තිබිණ. පුර නැගුම වැඩසටහනේ උදව්වෙන් සේවකයන්ට හොඳ සේවා පුහුණුවක් ලැබී තිබෙනවා. මෙතෙක් ඔවුන් අඳුරේ අතපත ගාමින් සිටි තත්ත්වයකයි පසුවී තියෙන්නෙ. එහෙත් දැන් ඔවුන් ගණන් හිලව් පිළිබඳ ඉතා හොඳ අවබෝධයන් ලබාගත් අය බවට පත්ව තිබෙනවා.

■ අරවින්ද රත්නායක

ග්‍රාම සංවර්ධනයට උපකාරවන කුඩා පාලම්

පූනගරි පාලම හදන්නට පෙර

නැගෙනහිර මහපොළව ගොවිතැනට නම් දූරු එකක්. ඒ නිසාම මෙහි බහුතරයක් ජනයා තම ප්‍රධාන ජීවනෝපාය කරගෙන තිබෙන්නේ ගොවිතැනයි. මේ ගොවිජනතාව කෙරෙහි වැඩි අවධානයක් යොමුකර ඇති වග පුර නැඟුම සංවර්ධන ව්‍යාපෘති දෙස බැලූ විට පෙනීයයි. ගම්මාන නාගරීකරණය කිරීමේ මෙම වැඩසටහන යටතේ කුඩාපාලම් (Culverts) නිර්මාණය කිරීම ප්‍රශස්ත කටයුත්තකි.

බහුතරයක් ගොවිබිම්වලින් සැදුම් ලත් ගම්මානවල මෙවැනි කුඩා පාලම්වලට හිමිවන්නේ වැදගත් තැනක්. ඇළ මාර්ග සමඟ සම්බන්ධ කිරීමටත්, නියරවල් සම්බන්ධ කර ජනතාවගේ ගමන් බිමන් පහසුකිරීමටත් ජලපෝෂණ ප්‍රදේශ හරහා යන පාරවල් ගමන් බිමන් සඳහා පහසුවෙන් යොදා ගැනීමටත් කුඩා පැලට් අවශ්‍යවේ.

නැගෙනහිර පළාතේ කන්තලේ, පුල්මුඩේ, පදවි ශ්‍රීපුර වෙරුගල් යන ගම්මානවල මෙවැනි කුඩා පැලට් (Culverts) පුර නැඟුම වැඩසටහන මඟින් ඉදිකර තිබේ.

ත්‍රිකුණාමලයේ නොසිදෙන මහවැලි ගඟේ ජල සම්පත නිසාවෙන් බැලූ බැලූ අත හරිතවර්ණ ගැන්වී ඇති සාරභූමියකි. මෙහි බහුතරය ලෙස ජීවත්වන්නේ දෙමළ ජාතිකයෝය. පසුගිය යුද සමයේ කැලැල් දරා සිටින ප්‍රදේශවලට මේ ප්‍රදේශයෙන් අයත්ය. වෙරුපාල් ප්‍රදේශයේ මැද ලෙස පූනගර්, පූමරන්නච්චේනයි, ඊට්විලිම්පත්තු වැනි ගම් පිහිටා තිබේ. මේවා වී ගොවිතැනට සුදුසු ප්‍රදේශ ලෙස පවතී.

මේ ප්‍රදේශවලට යාබදව තවත් ගොවිබිම් පිහිටා ඇති හෙයින් එකී ගොවීන්ටත් කුඩා පාලම්වල අවශ්‍යතාව ඇති වේ. එසේම වැසි සමයේ හටගන්නා ගංවතුරෙන් මේ ජනයා රැක ගැනීමට නම් කුඩා පාලම් මේ ප්‍රදේශයේ ඉදිකිරීම අත්‍යවශ්‍යයයි.

මේ අවශ්‍යතාව වටහා ගත් පුර නැඟුම වැඩසටහන ඒවා සපුරාලීමට ඉදිරිපත් විය. සමස්තයක් ලෙස මේ ප්‍රදේශවාසීන්ගේ ඉල්ලීම්වලට අනුවත් ප්‍රදේශවාසීන්ගේ බලවත් සහයෝගයත්, ඔවුන්ගේ සැලසුම්කරණයත් ඇතිව මෙම පාලම් ඉදිකර දෙනු ලැබීය.

පූනගරි ගම්මානයේ කුඩා පාලම ඉදිවෙන්නට පෙර ඇළ මාර්ගය හරා තල්කොට දමා සාදාගත් පාලම ප්‍රදේශවාසීහු භාවිතා කළහ. මෙහි ජනයා තම ගමන් බිමන් අවශ්‍යතා ඉටු කර ගත්තේ එමඟිනි. එහෙත් ඇළ මාර්ගවලින් ගලා එන ජලපහර වැඩි වූ විට තල් කොටන්වලට උඩින් ජලය ගලා යයි. මෙයින් ගම්වාසීන්ගේ ගමන් බිමන්වලට මෙන්ම ගොවිතැනට ද බාධා එල්ල විය. වෙරුගල් ප්‍රදේශයේ පූනගරි ගමෙහි ඉදිකෙරුණු කුඩා පාලම අපිත් දුටුවෙමු. පාසල් ළමෝද, ගොවියෝද, මහජනයාද මේ පාලමෙන් එගොඩ මෙගොඩ වෙමින් සිටියහ.

වෙරුගල් ප්‍රදේශයේ පූනගරි ගමෙහි වෙසෙන 45 වැනි වියෙහි පසුවන අෂ්පමලර් මහේන්ද්‍රන් අපත් සමඟ අදහස් පළ කරමින්

පුෂ්පමලර්

පූදින්වරන්

රාකාන්ති

''මුලින්ම කොටං දෙකක් දාලා තිබුණා. ඒකෙන් එගොඩ වෙන්ඩ ගිහින් වැටි වැටි යන අවස්ථාත් තිබ්බා. පාලම හැදෙන්න කලින් ඒ දණ්ඩට උඩින් අඩි දෙක තුනක් උසට ගංවතුර ගහගෙන යනවා''යි කීවාය.

ඔතනින් යන්ඩ එන ඉස්කොලෙ යන පොඩ්ඩෝ ලිස්සලා වැටිලා ඉස්කෝලේ නොගීන් ආපහු ගෙදර යන අවස්ථාත් තිබුණා. සමහරදේට මං පිටි පස්සෙන් ඇවිදගෙන ආවදා හතරපස් දෙනෙක්ම වතුරට වැටෙනවා මම දකලා තියෙනවා. මුල ඉඳලම මෙහේට පාලමක් තිබුණෙම නෑ.'' අපත් සමඟ එසේ කීවේ ත්‍රිකුණාමල හිරුවල්ලුවර් විද්‍යාලයේ 11 වැනි වසරේ ඉගෙන ගන්න සුබේසන් ප්‍රදීස්වරන්.

කන්තලේ ජයන්තිපුර පුංචි පාලම

''වාන් ඇළ ගමට පාලම් නැත්නම් ලොකු ප්‍රශ්නයක් වෙලයි තිබ්බේ. මේ ගමේ වැසියන්ට මේ නිසාම කිලෝමීටර පහක පමණ වටයක් ගැසීමට ද සිදු වී තිබිණි. මේ ප්‍රදේශයට පුර නැඟුම යටතේ පාලම් තුනක්ම හදලා දුන්නේ ඒ නිසයි.''

''පාලම හදන්න කලින් වටයක් ගහලයි අපි ආවේ ගියේ. ගංවතුර කාලෙට අමාරුයි. පාලම හින්දා දැන් හොඳයි. දැන් ළමයිනුත් මේ පාලම නිසා පහසුවෙන් එගොඩ මෙගොඩ වෙනවා. දවසේ වැඩ ටික කරගන්ඩත් පහසුයි.'' එහෙම කියන්න පූනගරි 9 කණුවේ පදිංචි කනගරත්නම් රාසායන්හි.

පාලම හැදීම නිසා තමන්ට යන්ඩ එන්ඩ සිද්ධ වුණු දුර ප්‍රමාණය අඩු වී ඇති නිසා කාලය පිරිමහගෙන පහසුවෙන් වැඩකටයුතු කරගන්නට අවස්ථාව උදාවී ඇතැයි ප්‍රදේශවාසීන් පවසනවා. අවුරුදු තිහකට වැඩි කාලයක් ගල් කඳන් හරහා අපහසුවෙන් එගොඩ මෙගොඩ වූ ප්‍රදේශවාසීන්ට පළල් කොන්ක්‍රීට් පාලමෙන් පහසුවෙන් හා ආරක්ෂාකාරීව ගමන් බිමන් යන එන තත්ත්වයක් උදාවී තිබේ.

මේ පිළිබඳ පාසල් ළමුන් කීවේ ''ඉස්කෝලෙ ගමනටත් මේ පාලම හැදුණු එකෙන් හොඳක් වුණා. පාලම හැදෙන්න කලින් අපි කිලෝමීටරයක් වටේ ගිහිල්ලයි ඉස්කෝලෙ ආවේ ගියේ දැන් ඉතින් අපිටත් ගමන පහසුයි.'' කියායි.

ජනතාවට බෙහෙවින්ම අවශ්‍ය මෙබඳු සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වන විට, ජනතාවගෙ පැත්තෙනුත් ඊට තමන්ට හැකි උපරිම සහයක් ලබා දෙනවා. පුර නැඟුම වැඩසටහනේ මෙය විශේෂ ලක්ෂණයක්.

කන්තලේ ප්‍රාදේශිය සභාවට අයත් මෙම ප්‍රදේශයේ ජනයාගේ ප්‍රධාන ජීවනෝපාය වී තිබෙන්නෙ ගොවිතැනයි. කොළඹ ත්‍රිකුණාමල මාර්ගයේ පිහිටි ගොවි ගම්මානයකි මේ. මෙහි බහුතරය සිංහල ජාතිකයන් වුවද මේ ගමේ මායිම් ආශ්‍රිතව මුස්ලිම් හා දෙමළ ජනයාද වාසය කරති.

කන්තලේ ප්‍රදේශයේ ගංගා රැසක්ම දැකිය හැකිය. මේ නිසාම ඒවා හරස්කර ජනතාවගේ ගමන් පහසුකරනු වස් කුඩා පාලම් නිර්මාණය කිරීමේ අවශ්‍යතාවන් තිබිණි. එය ජනතාවගේ බලාපොරොත්තුවක් ද විය. පුර නැඟුම ඒ ජනයාගේ බලාපොරොත්තු ඉටු කළේය. ඔවුන් අත් නොහැරියේය.

''වාන් ඇළ ගමට පාලම් නැත්නම් ලොකු ප්‍රශ්නයක් වෙලයි තිබ්බේ. මේ ගමේ වැසියන්ට මේ නිසාම කිලෝමීටර පහක පමණ වටයක් ගැසීමට ද සිදු වී තිබිණි. මේ ප්‍රදේශයට පුර නැඟුම යටතේ පාලම් තුනක්ම හදලා දුන්නේ ඒ නිසයි.'' කන්තලේ ප්‍රාදේශීය සභාවේ ලේකම් රොහාන් දසනායක අප සමඟ කීවේය.

පාලමක් නැති කාලෙ තමන් විඳි ගැහැට පිළිබඳව ගොවි මහතකු වන ප්‍රසන්න සම්පත් මෙසේ කීවේය. ''ඉස්සර අපි කුඹුරට ගියෙන් හරිම අමාරුවෙන්. ඒකට වටයක්ම යන්ඩත් සිද්ධ වුණා. පාරවල්වල රස්තියාදු වෙන්න සිද්ධ වුණා. වී ගෝනි ගෙනියන්ඩත් අපහසු වුණා යි ඔහු කීවේය.

ඉස්සර අපි ගඟෙන් එගොඩ වුණේ ගඟෙ බැහැලයි. එතකොට ඉතිං ඇඳුම් ටික සේරම තෙමෙනවා. ඇඳුම් ඉක්මනට කිළිටි වෙනවා. අපිට මේ වගේ පාලමක් හදලා දෙන්න තීරණය කළ එක හොඳයි.

රොහාන් දසනායක

සකලසූරිය

සම්පත්

නිෂාන් බණ්ඩාර

ඉස්සර අපි ගඟෙන් එගොඩ වුණේ ගඟෙ බැහැලයි. එතකොට ඉතිං ඇඳුම් ටික සේරම තෙමෙනවා. ඇඳුම් ඉක්මනට කිළිටි වෙනවා. අපිට මේ වගේ පාලමක් හදලා දෙන්න තීරණය කළ එක හොඳයි.

වාන් ඇල ගම්මානයේ වෙසෙන 56 හැවිරිදි සමරවීර සකලසූරිය, ''මේ පැත්තෙ ඔක්කොම වගේ ගොවිතැන් කරන්නෙ. ගොයම් ටික උස්සං එද්දිත් අපි එන්නෙ ගඟේ බැහැලා. ඒත් දැන් නම් කුඹුරට ගිහින් එන්නෙත් මුට්ටි කර ගහගෙන එන්නෙත් පාලමෙන් නිසා ඒක අපට ලොකු පහසුවක්. හොඳ ආදායමක් හම්බවෙනවා.''යි කීවේය.

උප ව්‍යාපෘතියේ නම
ජයන්තිපුර පාලමේ ඉතිරිය ගොඩනැගීම
ගිවිසුම් අංක
NELSIP/EP/TR/RACLG/W/03
කොන්ත්‍රාත් මුදල
රු 1, 476, 079.00
ක්‍රියාත්මක කරන ආයතනය
කන්තලේ ප්‍රාදේශීය සභාව
කොන්ත්‍රාත්කරු
ජනශක්ති ප්‍රජා මධ්‍යස්ථානය
කොන්ත්‍රාත් කාල සීමාව
මාස 03

''ඉස්සර නම් අපි එගොඩ වෙන්නේ ගඟේ බැහැලයි. එතකොට නම් අපේ ඇඳුම් එහෙමත් සෑහෙන්න කිළුටු වෙලා තියෙනවා. ඒ නිසා අපට මේ වගේ පාලමක් හදලා දීපු එක නම් ලොකු දෙයක්.'' එහෙම කිව්වෙ කන්තලේ මධ්‍ය මහ විද්‍යාලයේ ඉගෙන ගන්න ටී.ජී. එරංග බණ්ඩාර

මෙවැනි කුඩා පාලම් ඉතා දුෂ්කර ප්‍රදේශවල වෙසෙන ජනයාට තනාදීම නිසා ඒ ජනතාවගේ ගමන් බිමන්, රැකියා, ආදී දේ හොඳින් කරගන්නට අවස්ථාව ලැබී ඇතැයි ප්‍රදේශවාසී ජනයා විමසනවා.

කන්තලේ ප්‍රදේශයේ ජයන්තිපුර, යෝධ ඇල, පට්ටුකච්චිය යන ප්‍රදේශවල පුර නැඟුම යටතේ මෙවැනි කුඩා පාලම් නිර්මාණය කර තිබෙනවා. කෘෂිකර්මාන්තය තම ජීවනෝපාය කොටගත් ජනයාට මෙවැනි කුඩා පාලම් දැඩි අවශ්‍යතාවන්ව පැවතිණ.

එම නිසා දෙමළ ජනයා බහුතරයක් වෙසෙන වෙරුගල් ප්‍රදේශයෙන් බහුතරය සිංහල ජනයා වෙසෙන කන්තලේ ප්‍රදේශයෙන් ඉදිකර තිබෙන මෙම කුඩා පාලම් පුර නැඟුම වැඩ සටහන ජාති, ආගම්, භේදයකින් තොරව ජනතාවගේ අවශ්‍යතා සැලකිල්ලට ගෙන කොපමණ සේවාවක් සිදු කරමින් සිටිනවාද යන්නට කදිම නිදසුනකි. ■

අත්දැකීම්

තිරුබාලසිංගම් සිවලිංගම්
තාක්ෂණික නිලධාරි
මන්මුණෙ බටහිර, ප්‍රාදේශීය සභාව

තක්සේරුව මොනතරම් ගැඹුරට ප්‍රයෝජනවත් විදිහට ක්‍රියාත්මක වෙනවද කියන දේ මම ඉගෙනගන්නෙ පුර නැඟුමෙන්. ඒ වගේම තක්සේරුවක් හරියට කරන විදිහත් ඒ කටයුත්තට ජනවර්ග තුනම සහභාගිවෙන්ඩ ඕනය කියන කාරණයක් මෙතෙන්දි මම දැන තියාගත්තා.

උන්නිච්චෙ ඇළ මාර්ග පාර හදද්දි කොන්ත්‍රාත් ගත්තු අයගෙන් ප්‍රශ්න ඇතිවුණා. වවුනතීවුවල ඉඳලා ගොඩක් දුර, සාමාන්‍යයෙන් කිලෝමීටර 22 ක් විතර ඒ පාර කොන්ත්‍රාත් එක කරපු කෙනා අක්කරයි පත්තුවේ කෙනෙක් නිසා වෙලාවකට එනවා. වෙලාවකට එන් නෑ. එයාව සම්බන්ධ කරගන්ඩත් අමාරුයි. ඒ පාරට අදාළ තක්සේරුව කෙරුණේ කලින්. ඒත් හදිසියේ ඇතිවුණු මහ වැස්සක් ගංවතුරත් නිසා පාරෙ අතරමග හේදිලා ගියා. ඇල පාරත් ගංවතුරට ගහගෙන ගියා.

මේ නිසා මම මේ ගැන ව්‍යාපෘතිය භාරව හිටිය ඉංජිනේරු මහතාට පැමිණිලි කෙරුවා. ඒකට එයා කිව්වා වේරියේෂන් (Variation) කරන්ඩය කියලා. ඇත්තම කිව්වොත් මම මේ වචනෙ දැනගත්තෙත් එතකොටයි. ඒ කියන්නෙ නැවතත් තක්සේරු කරන එක. ඒක කරන විදිහත් කියලා දුන්නෙ පුර නැඟුමයි. ඊට පස්සෙ වැලි පුරවලා පාර හැදුවා.

ඊළඟට මහජන පොළ ගොඩනැගිල්ල මට හොඳට මතකයි. දවස් තුනක් ඇතළත මිලියන හතළිහක ඇස්තමේන්තුවක් දෙන්නය කියලා මගෙන් ඉල්ලුවා. කරන්න බැරි දෙයක්. නමුත් කොහොම හරි මහන්සි වෙලා කරලා දුන්නා. රෑ දවල් නැතුව පළාත් පාලන කාර්යාලයේ ඉඳගෙනයි. ඒ ඇස්තමේන්තුව හැදුවෙ. එහෙම කෙරුවත් යම් යම් දේවල් මඟ ඇරිලා තිබුණා. උදාහරණයක් විදිහට පිල්ල මඟහැරිලා තිබුණා. පස්සෙ පුර නැඟුමෙන්ම ලැබුණු අත්දැකීමක් ප්‍රයෝජනයට අගෙන ඒකට වෙනව වේරියේෂන් (Variation) එකක් කරලා වැඩේ ඉවර කෙරුවා.

කට්පත්තේණි ගම වැස්සකාලෙට පාරවල් වැහිලා සබඳකම් ඇණ හිටිනවා. ගමන බිමනට බාධාවෙනවා. ළමයි ඉස්කෝලෙ යන්නෙ නෑ. ගෑනු උදවිය ගෙයින් එළියට බහින්නෙ නෑ. හේතුව මැටි පාලම කැඩිලා ගංවතුර ගලනවා. මේකට විසඳුමක් හැටියට පාලමක් හදන්න තීරණය වුණා. මම දත්ත අඳුරන ඉංජිනේරුවරයෙකු උදව් උපකාරයක් අරගෙන ඒ පාලම හදලා ඉවර වුණාම අමතරව තවත් පාලමක් හැදුවා. දැන් ළමයි ටික කරදරයක් නැතිව ඉස්කෝලෙ යනවා.

මෑතකදී ලෝක බැංකුවේ තාක්ෂණික කණ්ඩායමක් ලංකාවට ආවා. වවුනතීවු පොළේ කරලා තිබුණු හැම වැඩක්ම පිරිසිදු කෙරෙව්වා. ඒත් එයාලා පරීක්ෂා කරද්දි එක් තැනක ලෑලි කෑල්ලක් ඇලිලා තිබිලා තියෙනවා. පස්සෙ අපිට ගොඩක් කරුණු කාරණා කියලා දුන්නා. තාක්ෂණික කරුණු කාරණා ගැනත් කියලා දුන්නා. මිලියන 47 ක වැඩබිමේ ව්‍යාපෘති කරවලත් තිබුණා. වැඩ සැලැස්මක් හදලා යැව්වා. ඒකට හේතුව පුර නැඟුම තමයි ඒ තරමට අපේ දක්ෂතා වැඩිවෙලා.

ජන හඬ

ජනතා සහභාගිත්වයක් සහිත සංවර්ධනයක අවශ්‍යතාව පුර නැඟුම වැඩසටහන අවධාරණය කරයි. යුද්ධයෙන් දැඩි ලෙස බැට කෑ ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීමෙහිලා මෙම වැඩසටහන යම් පමණක සාර්ථකත්වයක් ලබා ඇතැයි යන්න මහජනතාවගෙන් මතයයි. මෙම වැඩසටහන අවසන් විය යුතු කාලයට ළඟා වී ඇති තත්ත්වය තුළ මහජනයාත්, නිලධාරිනුත් තම අවශ්‍යතාත් තමන්ට වැරදුණු කාරණා ගැනත් අප සමඟ විවෘතව කතා කළහ.

ලෝගේසුන් සුලක්සන් - ආරයම්පදි

කන්නාගිඅම්මන් කෝවිල් පාරේ තියෙන ළමා උද්‍යානයේ දොරටුව හොඳට හදලා දෙන්න ඕන. වැටවල් ටිකත් හරිගස්සන්න ඕන. මුරකාරයෙක් දාන්නත් ඕන. ළිඳට පොල් කටු එහෙමත් දාලා තියෙනවා. ඩෙංගු බෝවෙන්නත් අහළ පහළ අය පීඩාවට පත්වෙන්නත් ඉඩ තියෙනවා. මේ නිසා මේකේ අඩු පාඩු ටික හරියට හදලා දෙන්න ඕන.

තංගවඩිවේල් රමේෂ් කුමාර් - එගට් නිවාස යෝජනා ක්‍රමය

පාර දම්මට පස්සෙ මිදුලට එන වතුර බැහැලා යන්නෙ නැතුව මිදුලෙම රැඳෙනවා. පාර හදන ඒක හොඳයි. ඒත් දැන් මේ තියෙන විදිහට මිදුලත් වතුරෙන් පිරෙනවා. පාර දිගේ එන වතුර සේරම අපේ වත්තට එන හින්දා ඉක්මනින්ම මේ කාණු ටික හැදෙන්ඩ ඕන.

නිල්ලයප්පෝඩි මාණික්කප්පෝඩි - කොක්කට්ටිච්චෝලයි

අපිට බොන්ඩ වතුර ටික ඕන. උන්නිච්චෙ ඉඳලා නාත්තන්කුඩියට වතුර යනවා. ඒත් නවගිරි වැවෙන් අපට වතුර ටික අරගන්ඩ විදිහක් නෑ. ඒක හින්දා අපට පානීය ජලය ව්‍යාපෘතියෙන් ලබලා දෙන්න.'

සින්නතුරෛ පර්මේශ්වරි - කොක්කට්ටිච්චෝලයි

කොක්කට්ටිච්චෝලෙ පොළ තියෙන්නෙ සෙනසුරාදට විතරයි. එහෙම නැතුව හැමදාම කෙරෙනවා නම් මාර්කට් එකෙන් මමත් කඩයක් ගන්නවා

ශිවලිංගම් ගුණරත්නම්- සභාපති නාවිදන්වෙලි

ප්‍රාදේශීය සභාවක් විදිහට අපට ලැබුණු රුපියල් මිලියන 93 විතරක් තියාගෙන අපට සීමාසහිත සංවර්ධන වැඩ කොටසක් විතරයි කරන්ඩ පුළුවන් වෙන්නෙ. මේ වැඩසටහන තවත් අවුරුදු 3ක් විතර කෙරුණොත් පළාතින් මිනිස්සු තවත් දියුණු වේවි. ඉදිරියේදී අධ්‍යාපන වැඩත් ළමා උද්‍යාන විනෝද කටයුතු වූයේ දේවල්වලට අවස්ථාව ලැබුණොත් ප්‍රාදේශීය සභාවට ආදායමක් ලබන්නත් පුළුවන් වෙයි.'

ඉලයතම්බි දයාගරන්, පරණ තැපැල් කන්තෝරු පාර, තිරුක්කෝවිල් විනායගපුරම්

මේකට දාපු කොන්ක්‍රීට් පාර උස වැඩි හින්දා, වතුර බැහැලා යන්නෙ අමාරුවෙන්. ඒ හින්දා කාණු ටිකක් හදලා දෙන්ඩ.

සින්නම්බි ශාන්තකුමාර්, ලේකම්, වෙරුගල් ප්‍රාදේශීය සභාව

ගම්මටටමේ පාරවල්, පොළවල්, මාළු වෙළෙඳසැල්, වගේ දේවල් අපේ ප්‍රදේශයටත් ලැබෙනව නම් අපේ මිනිස්සුන්ගෙ ප්‍රශ්න ටිකක් අඩුවෙයි. අලුත්වැඩියා කරපු ජලසම්පාදන වාර්මාර්ග, වැව් මෙහේ තියෙන්නෙ බොහෝම ටිකයි.

එස්.පී. චන්දන විජයකුමාර - සභාපති ගෝමරන්කඩවල

අපේ ප්‍රදේශයේ විරැකියාව හරියට තියෙනවා. මෙහේ කාන්තාවෝ වෙනත් දිස්ත්‍රික්කවලට ගිහිල්ලා රෙදි විවීම් වැඩ කරලා එනවා. අපේ ප්‍රදේශයටත් රෙදිවියන කර්මාන්තශාලාවක් ලැබුණොත් විරැකියා ප්‍රශ්නෙ සෑහෙන්න විසඳේවි.

මුහමඩ් ජබාර් හෙරූස් - මුත්තූර් කඩ සංකීර්ණය

මේ කඩ පෙළ අයිනෙ අඩි 12 ක විතර පොඩි පාරක් වගේ කොන්ක්‍රීට් ටිකක් දාලා දෙන්ඩ පුළුවන් නම් ගොඩක් හොඳයි. ඉස්සරහට එන්ඩ තියෙන වැස්සෙන් ආරක්ෂා වෙන්ඩ පුළුවනි.

එච්.එම් ඉනුලතා - ගොවිතැන

අපට තියෙන ලොකුම ප්‍රශ්නෙ වතුර. බවුසර්වලින් ගෙනල්ලයි අපිට වතුර බෙදන්නෙ. සමහර දාට සතියටම එකවතාවයි වතුර බෙදන්නෙ. තවත් වෙලාවකට මාසෙටම දෙපාරයි වතුර එන්නෙ. අපේ අයට තියෙන ලොකුම ප්‍රශ්නෙ බොන්න වතුර නැතිකමයි. අපේ ඒ ප්‍රශ්නෙ විසඳලා දෙන්ඩ.

■ ශානක රණසිංහ

අවසන් ගමනේදීන් එකට ම එන සැබෑ මිතුරා

'රැගුමන් අවසන හිමිවෙයි අඩි හය' යන වචන කිහිපය ජීවිතවල අස්ථිර බව මොනවට පැහැදිලි කරයි. මිහිපිට උපන් සෑම සත්වයකුම කිසියම් දවසක මියෙනවාය යන්න ස්වභාවධර්මයේ නියතයක්. එය වෙනස් කරන්නට හෝ වළකන්නට කිසිවෙකුටත් පුළුවන්කමක් නෑ.

රැගුමන් අවසන හිමිවෙයි අඩි හය' යන වචන කිහිපය ජීවිතවල අස්ථිර බව මොනවට පැහැදිලි කරයි. මිහිපිට උපන් සෑම සත්වයකුම කිසියම් දවසක මියෙනවාය යන්න ස්වභාවධර්මයේ නියතයක්. එය වෙනස් කරන්නට හෝ වළකන්නට කිසිවෙකුටත් පුළුවන්කමක් නෑ.

උපතක් විපතක් යන දෙකම මහ බඹා විසින් මිනිස් ඉරණමේ ලියා තබා තිබනෙවා. සෑම මනුෂ්‍යයෙක්ම බලාපොරොත්තු වෙන්නේ තමන්ගේ අවසන් නුස්ම පොද සැනසිල්ලේ වාතලයට මුසු කරන්නයි. ජීවිත ගමනේදී ජීවිත සටනේදී අනේක විධ අභියෝගවලට මුහුණ දෙමින් උඩුගම් බලා පිහිනන වෙහෙසකර වූ ගමනේ නිමාව හෙවත් මරණයවත් සැනසිලිදායක විය යුතුය. යන්න මිනිසාගේ අපේක්ෂාවයි.

එහෙත් මේ ප්‍රාර්ථනාව ඉටු කරගත් පිරිස ඉතා සුළුය. අගහිඟකම්, පවුලේ තත්ත්වය, වටපිටාව යනාදී වූ බොහෝ හේතු නිසා බහුතරයකගේ අපේක්ෂා ඉටු නොවනු දකින්නට ලැබෙයි. අද වන විට වැඩිවී තිබෙන ජනගහනයේ වැඩිකම නිසාම මළ සිරුරක් වළ දමන්නට පවා ඉඩක් සොයා ගැනීම අපහසු වී තිබෙනවා. මේ නිසාම කොළඹ බඳු ජනාධික නාගරික ප්‍රදේශවල විදුලියෙන් ක්‍රියාත්මක ආදාහනාගාර ඉදිවී තිබෙනවා. මේ පසුබිමේදී 'පුර නැඟුම' වැඩසටහනින් සුසානභූමි නිර්මාණය කිරීමේ ව්‍යාපෘතියකුත් ක්‍රියාවට නගා තිබෙනවා.

විශේෂයෙන් දමන, කන්තලේ, සේරුවිල යන ප්‍රාදේශීය සභාවන් මේ කටයුත්ත කඩිනමින් ක්‍රියාත්මක කරනු දැකිය හැකියි. මේ පිළිබඳ අප සමඟ කතා කළ කන්තලේ ප්‍රාදේශිය සභා ලේකම් රොහාන් දසනායක, ''කන්තලේ ජනගහණය වැඩිවෙලා තියෙනවා. වගේම දැනට තියෙන සුසාන භූමියේ ඉඩකඩ මදි වී තිබෙන නිසයි අපි මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්නෙ. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයටම විදුලියෙන් ක්‍රියාත්මක ආදාහනාගාරයක් නෑ. අපි මේක හදන්නෙ ඒ නිසයි.'' ඔහු තම ප්‍රදේශයට විදුලි ආදාහනාගාරයක අවශ්‍යතාව පැහැදිළි කළා.

මේ වන විට අදාහනාගාරයේ වැඩකටයුතු සියයට හැටක් අවසන් වී ඇති හෙයින් තවත් මාස එකහමාරක පමණ කාලයක් ඇතුළත එහි වැඩකටයුතු මුළුමනින්ම අවසන් කිරීමට හැකිවනු ඇතැයි විශ්වාසය පළ කළ ඔහු මෙහි ඉදිකිරීම් අවසන් කළ පසු එහි නඩත්තු කටයුතු සම්පූර්ණයෙන්ම කන්තලේ ප්‍රාදේශීය සභාව භාරග න්නා බව ඔහු අප සමඟ පැවසුවා.

කන්තලේ ඉදිකෙරෙමින් තිබෙන විදුලි ආදාහනාගාරය

ඉරක්කන්නි සුසාන භූමියට යන පාර..

පුර නැඟුම වැඩසටහන යටතේ මෙසේ නිර්මාණය කෙරෙන සුසාන භූමි වෙත යාමට ඇති පැරණි මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම හෝ මාර්ගයක් නොමැති අවස්ථාවල අලුතින්ම මාර්ග නිර්මාණය කිරීමක් දැකිය හැකියි.

කුච්චවේලි ප්‍රාදේශීය සභාවේ වාම්ලෙයුට්ටෑ ගම්මානයේ ජනතාව සුසාන භූමියට යාමට සිදුවන අවස්ථාවල විවිධ දුෂ්කරතාවලට මුහුණ පෑහ. විශේෂයෙන්ම සුසාන භූමියට යන මාර්ගය දැඩි සේ අබලන්ව වළ ගොඩැලි සහිත එකක් වූයෙන් එහි ගමන් කිරීම ඉතා අසීරු වී තිබිණි. මේ තත්ත්වය නිසා ප්‍රදේශවාසීන්ට මෘත දේහයක් සුසාන භූමිය වෙත ගෙනයෑමට දැඩි වෙහෙසක් දැරීමට සිදු විය. මේ තත්ත්වය තේරුම් ගෙන ප්‍රදේශවාසීන්ගේ ප්‍රමුඛතාව අනුව සුසාන භූමිය වෙත යන මෙම මාර්ගය පුර නැඟුම යටතේ ප්‍රතිසංස්කරණය කරනු ලැබිය.

ඉරකුක්කන්නි (ඉරක්කන්කණ්ඩි) වැලෙයුට්ටෑ කියන මේ ප්‍රදේශ දෙකම විශාල ප්‍රදේශ දෙකක්. එම ප්‍රදේශයේ දෙමළ අය සඳහා සුසාන භූමියක් තිබිණි. එයට යාමට තිබුණේ බොරළු පාරකි. එහෙත් මේ වන විට එම මාර්ගය මුළුමනින්ම ප්‍රතිසංස්කරණය කර, කාණු පද්ධතියක්ද ඉදිකෙරෙමින් තිබෙන අතර එහි කටයුතු අවසන් අදියරට ළඟා වී තිබේ. එය කිලෝමීටරයක් පමණ දිග මාර්ගයක් බව කුච්චවේලි ප්‍රාදේශීය සභවේ ලේකම් කාදර් මුහයිදීන් කියයි.

මෙම මාර්ගය පිළිසකර වීම නිසා ඉදිරියේදී අවසන් කටයුතු සිදුකරන්නට සුසාන භූමිය වෙත පහසුවෙන් යා හැකි බව කුච්චවේලි ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා විශ්වාසය පළ කළේය. මෙහි මෙම මාර්ගයට සමාන්තරව කාණු පද්ධතියන් නිර්මාණය කර තිබීම විශේෂත්වයකි.

පුර නැඟුම වැඩසටහන මනුෂ්‍ය ජීවිතයේ සෑම පියවරකදීම ඔවුන් හා සමඟ එකට ම ගමන් කරනු දැකිය හැකිය. කුඩා දරුවාගේ සතුට සැලකිල්ලට ගෙන ළමා උද්‍යානද, කුඩා දරුවා වැඩි හිටි තරුණයකු වූ කළ ඔහු තුළ ඇති ක්‍රීඩා කුසලතා වර්ධනය කරදෙන්නට ක්‍රීඩා පිට්ටනිද, පවුල් ජීවිත පවත්වාගෙන යාමට අත්‍යවශ්‍ය පානීය ජලය, විදුලිය ආදියත් තම දෛනික ජීවිතයේ කටයුතු බාධාවකින් තොරව පහසුවෙන් කර ගැනීමට අවශ්‍ය මාර්ග පහසුකම්, පාලම් යනාදී අවශ්‍යතා ඉටුකර දී අධ්‍යාපනයේ මිනිසකුගේ අවසන් අවස්ථාව වන මරණයේදීත් මිනිසා අත නොහැර ඔහු සමඟම සුසාන භූමිය දක්වා යන මිතුරකු බවට පුර නැඟුම වැඩසටහන පත්ව ඇති වග එම වැඩසටහනේ මැදිහත්වීමෙන් ඉදිකෙරෙමින් තිබෙන සුසාන භූමි අපට පසක් කර දෙයි.

මේ අර්ථයෙන් ගත් කළ පුර නැඟුම වැඩසටහන හා බැඳි ව්‍යාපෘතීන් මින් පෙර ක්‍රියාත්මක සෙසු වැඩසටහන් මෙන් නොව නැගෙනහිර ජනතාවගේ ජීවිතයේ අවසන් මොහොත දක්වාම ඔවුන් සමඟ අත්වැල් බැඳගනී. මෙවන් විශේෂ ලක්ෂණයන්ගෙන් හෙබි පුර නැඟුම වැඩසටහන ඉදිරි කාලවලදීත් තමන් හා සමඟ අත්වැල් බැඳ ඉදිරියටම යනු දකීම මෙහි ජනතාවගේ පැතුම වී තිබේ.

වාලෙයුට්ටා සුසාන භූමියට යන පාර

නිර්මාණය
මාධ්‍ය ඒකකය
නිර්මාණ හැකියා, සංවර්ධන
මධ්‍යස්ථානය

උපදේශකත්වය / අධීක්ෂණය
ශාන්ති සච්චිදානන්දම්
අන්බලගන් කෘෂ්

කළමනාකරණ කර්තෘ
ශාන්ති සච්චිදානන්දන්

ප්‍රධාන කර්තෘ
අරුලානන්දම් අරුල් සංජීන්

නියෝජ්‍ය කර්තෘ
කදිරේස පිල්ලෛ කාන්ඩීබන්

කර්තෘ මණ්ඩලය
සුජීව දිසානායක
අර්ෂාඩ් මුහම්මඩ්
හිමානි අමරතුංග
පාතිමා ෂප්නා
කයල්විලී මනෝහරදාස්
කුබේසිනි නන්නඅසන්
සුභාෂිණි ලෝගනාදන්
ශානක රණසිංහ
නන්දිනි හිරුනාවුකරසු
දේවිතා ධනපාලසිංගම්
තංගවඩිවේල් රමේෂ් කුමාර්

භාෂා පරිවර්තනය
සුජීව දිසානායක
පාතිමා ෂරිසා

පිටු සැකසීම
මුහම්මඩ් පිවේස්
රජීතරන් විනෝදනි

ඡායාරූප
ආදිත්යන්
රාජ්කුමාර්

චිත්‍ර /කාටූන්
අරුලානන්දම් සංජීත්
මුත්තනම්බි සසිත් කුමාර්

වාර්තාකරුවන්
අබ්දුල් හමීස්
මේකලා සීනිවාගම්
අරවින්ද රත්නායක
සබේසන් ජනාර්ත්නන්
කල්‍යාණි විජයකුමාර්
සෙල්ව චන්‍රන් දුවාරගන්

නිර්මාණ කරුවන්
පු. ජෙයාගරන්
අන්බලගන් කෘෂ්
මුරගේසු නඩරාජා
දමයන්ති කනගසූරියම්
පිල්ලයාන්නම්බි
ජෝශප් විජයකුමාර්
සුදාමඩ් මහේෂ්වරන්

සම්බන්ධීකරණ සහාය
වඩමලෛ රාජ්කුමාර්

තොරතුරු සහය
වෛත් සනාදන් මනිමේකලෛ

ප්‍රකාශනය
පුර නැගුම
තොරතුරු අධ්‍යාපන හා මාධ්‍ය ඒකකය
පුර නැගුම වැඩසටහන
නැගෙනහිර පළාත් සභාව